# දියමන්ති ව්‍යාපෘතිය

## ඉතිහාසය - 11 ශ්‍රේණිය

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දියමන්ති ව්‍යාපෘතියෙහි අදහස, ඉලක්ක හා ක්‍රියාවලිය

'' නිපුණතා පාදක අධ්‍යාපනික ප්‍රවේශය" තුළින් වත්මන් ශ්‍රී ලාංකේය දරු පරපුර තුළ අර්ථවත් ඉගෙනුමක් මත පරිපූර්ණ ජීවිතයකට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, හුරුපුරුදු රෝපණය කොට ඒවා වර්ධනය කර ගැනීමට මඟපෙන්වීම් සිදු කර ඇත. පාසල් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ අපේක්ෂාව වනුයේ සක්‍රීය මෙන්ම ප්‍රියජනක ඉගෙනුම් පරිසරයක් තුළ අත්දැකීම් ලබා ගැනීමට මඟපෙන්වීමත් ඒ මඟින් නිපුණතා පූර්ණ සමබර පෞරුෂයක් ඇති පුද්ගලයෙකු සමාජයට හිමිකර දීමත්ය. එහි අවසන් ඵලය වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයට යොදවන යෙදවුම් ප්‍රමාණයට සාපේක්ෂව, ඵලදායි නිමැවුම් ප්‍රමාණය වැඩි කිරීමෙන්, ගෝලීය ප්‍රවණතාවයට සරිලන පරපුරක් බිහි කිරීමත්ය.

එබැවින් සෑම පාසලක ම, සෑම ගුරුභවතෙකු විසින්  ම සෑම දරුවෙකුට ම සමාන ඉලක්ක සහිතව ඉගැන්වීම, පාඩම් සැලසුම් කිරීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ක්‍රියාකාරීව නිරත කරවීම, පන්ති කාමර ඇගයීම් හා තක්සේරුකරණය ඵලදායී ලෙෂ යොදා ගැනීම හා කාලය සඵලදායි ලෙෂ කලමනාකරණය කර ගැනීමට අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් ''දියමන්ති ව්‍යාපෘතිය" හඳුන්වා දී ඇත.

සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් හා ගුණාත්මක යෙදවුම් තෝරා ගැනීමට ගුරුභවතුන්ට අත්‍යවශ්‍ය මඟපෙන්වීම පමණක් මෙමගින් ලබා දී තිබේ. ගුරුවරයා තම නිර්මාණාත්මක හැකියාව මත විධිමත්ව ඉලක්ක වෙත ළඟාවිය යුතුය. මෙමගින් නව ලොවට උචිත නිපුණතා පූර්ණ පුරවැසියන් බිහි කිරීම හා එයට ගැලපෙන ගුරු භූමිකාවක් හා ක්‍රියාශීලී පන්ති කාමරයක් සහිත ඉගෙනුම් සංස්කෘතියක් නිදහස් අධ්‍යාපනයට දායාද කිරීම අපගේ අපේක්ෂාවයි.

එස්. කුරුප්පු ආරච්චි
සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

# දියමන්ති ව්‍යාපෘතියෙහි ප්‍රයෝජන

❖ **මෙම ලේඛන භාවිතා කොට අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියළුම කණ්ඩායම් මතු සඳහන් උපදෙස් පරිදි කටයුතු කර දරුවන්ට ඉගෙනුම් අවස්ථා වැඩි වශයෙන් ලබා දීමට ක්‍රියා කළ යුතුය.**

1. ගුරුභවතුන් විසින් සෑම ඒකකයක්ම නියමිත කාල වකවානු තුළ නිම කිරීම.
2. ඊට අදාල ඉලක්ක, පැවරුම් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා ඇගයීම් ලබා දීම.
3. මෙම ඉලක්ක පිළිබඳව දරුවන්, දෙමව්පියන් ආදී සියලුම පාර්ශව දැනුවත් කිරීම. ( ටියුෂන් ගුරුවරු ද මෙම ඉලක්ක අනුගමනය කිරීම ඵලදායි වේ.)
4. පළාතේ සියලුම ඇගයීම් හා වාර පරීක්ෂණ මෙම ඉලක්ක මත ප්‍රමිතිගතව නිර්මාණය කිරීම.
5. විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, අංශ ප්‍රධාන, විෂය ප්‍රධාන යන අභ්‍යන්තර අධීක්ෂණ කණ්ඩායම් ද, ගුරු උපදේශක, විෂය අධ්‍යක්ෂවරු ආදී සියළුම බාහිර අධීක්ෂක කණ්ඩායම් ද මෙම ඉලක්ක අනුව කටයුතු කිරීම.
6. සියලුම අධීක්ෂණ වර්තා මඟින් මෙම ඉලක්ක ළඟාකර ගෙන ඇති ප්‍රමාණය සහ එහි ගුණාත්මක තත්ත්වයන් තක්සේරු කිරීම.
7. ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ කාර්ය සාධනය මැනීමේ දී මෙම ඇගයීම් වාර්තා මත කටයුතු කිරීම.

❖ තම විෂයයට අදාල කාලය කළමනාකරණය කර ගැනීම සඳහා ගුරුවරයාට ද, විෂයයකට අදාලව උපරිම ඉගෙනුම් කාලයක් ලබා ගැනීම සඳහා ශිෂ්‍යයාට ද අධීක්ෂණය හා නියාමනය සඳහා අභ්‍යන්තරව හා බාහිර අධීක්ෂකවරයාට ද, පාසල තුළ විෂය මාලාව නිසි ලෙස කළමනාකරණය පිණිස විදුහලිපතිවරයාට ද, ඇගයීම් ප්‍රමිතිගතව සංවිධානය සඳහා අදාල කණ්ඩායම් වලට ද, දරුවා යන ගමන් මඟ සහ පාසලේ ක්‍රියාවලිය නිසි ලෙස දැකීම දෙමව්පියන්ට ද, පාසලට හා දරුවාට සහාය දීම පිණිස විවිධ බාහිර පාර්ශවයන්ට ද, කළමනාකරණ තීරණ ගැනීම සඳහා කළමනාකරුවන් හා පරිපාලකයන්ට ද මූල්‍ය ප්‍රගතිය හා ඵලය මැනීම සඳහා විගණන නිලධාරයාට මෙම ලේඛනය අතිශය ඵලදායී වේ.

# සමාජයීය විද්‍යා විෂයන් දියමන්ති ව්‍යාපෘතියට . . .

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පළාතට අයිති ග්‍රාමීය නාගරික, ලොකු කුඩා, ජනප්‍රිය හා ජනප්‍රිය නොවන සෑම පාසලක් තුළම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියත්, අභ්‍යන්තර/ බාහිර අධීක්ෂණ ක්‍රියාවලියත්, සම්භවන/සම්පින්ඩිත ඇගයීම් ක්‍රියාවලියත්, නිශ්චිත දින වකවානු, නිශ්චිත ක්‍රමවේද හා නිශ්චිත ප්‍රමිති සහිත ව ක්‍රියාත්මක කිරීම මගින් සෑම දරුවකු සඳහා ම සමාන ඉගෙනුම් අවස්ථා සම්පාදනයත්, අධ්‍යාපනයේ සම අවස්ථා සම්පාදනයත් ඉලක්ක කොටගෙන දියමන්ති ව්‍යාපෘති වැඩසටහන ක්‍රියාවට නැංවේ.

මේ අනුව පළාතේ සමාජ විද්‍යා ගුරු උපදේශකවරුන්ගේත්, විෂය ප්‍රවීණ ජ්‍යෙෂ්ඨ ගුරුභවතුන්ගේත් සම්පත්දායකත්වය ලබා ගෙන සකස් කරනු ලැබූ ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය විෂයයන්ට අයත් අධ්‍යයන ඉලක්ක, ආදර්ශ ඇගයීම් ආකෘති, ආදර්ශ ඉගෙනුම් ආධාරක ආදිය අනුගමනය කිරීම, සැලසුම් සහගත අධ්‍යයන ක්‍රියාවලියකට මග පාදයි. තවද ගුරුවරයාගේ කාලය මනා ලෙස කළමනාකරණයට මග පාදයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සෘණාත්මකව බලපෑමක් කරන, පාඩමට පූර්ව සූදානම සම්බන්ධව ඇතැම් ගුරුවරුන්ගේ තිබෙන ගැටළුත්, ඒකාකාරී ඉගෙනුම් ක්‍රමවේදයන් හේතුවෙන් බහුවිධ හැකියාවන්ගෙන් යුත් දරුවන්ට සිදුවන අවාසිදායක තත්ත්වයනුත් මෙතුළින් නිවැරදි කරගත හැකිය.

මෙහි දී විශේෂයෙන් ම අවධාරණය කළ යුතු කාරණාවක් වන්නේ දියමන්ති ව්‍යාපෘතිය දෙවන අදියර කොටසේ දී අප විසින් ඉදිරිපත් කරන ආකෘතිය ගුරුවරයාට කරන මග පෙන්වීමක් පමණක් වන අතර විෂය උගන්වන ගුරුවරයාගේ දැනුම අත්දැකීම් හා හැකියාවන් මත මෙම මගපෙන්වීම ඔස්සේ විෂය මාලාව නිර්මාණශීලීව සකස් කර ගත හැකිය. ආකෘතියකින් අප ඉදිරිපත් කරන ආදර්ශ ක්‍රමවේදයන්ට සීමා වීම අපේක්ෂා නොකෙරේ. සමාජීයය විද්‍යා විෂයයන්ට අදාළ ගුරු මාර්ගෝපදේශ සහ අනෙකුත් සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණශීලී ඉගෙනුම් අත්දැකීමක් වෙත සිසුන් යොමු කිරීමෙන් මෙහි ඇති ඉලක්ක වෙත වඩාත් සඵලදායි ලෙස ළඟාවීම ගුරුවරයා සතු වගකීම වේ.

ඒ අනුව මෙහි සඳහන් දින වකවානු අනුව ම, පාඩම් ඒකක අවසන් කර අදාළ ඇගයීම්වලට සිසුන් යොමු කිරීම අපේක්ෂා කරන අතර මෙය අප පළාතේ දරුවන් සමබර පෞරුෂයකින් යුක්ත ව සමාජයට දායාද කිරීමට ඔබ දක්වන මාහැඟි දායකත්වයට අත්වැලක් වනු ඇත.

ජේ. ඒ. ඩී. මාලින්ද
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යාව)
සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**11 ශ්‍රේණිය**

**පළමු වාරය** **ඉතිහාසය**

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| **11** | කාර්මික විප්ලවය | 1.1 හැඳින්වීම | ජනවාරි 19 | 08 | පැය 05 වි. 30 | |
| | | 1.2 කාර්මික විප්ලවයේ ආරම්භය හා වර්ධනය | | | | |
| | | 1.3 කාර්මික විප්ලවයේ ප්‍රබෝධය | | | | |
| | | 1.4. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම | | | | |
| | ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම | 2.1 බ්‍රිතාන්‍යයන් ආසියාවට පැමිණීමේ පසුබිම | පෙබරවාරි 16 | 12 | පැය 08 | |
| | | 2.2 බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු | | | | |
| | | 2.3 - බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම<br>- දූත ගමන්<br>- 1796 මුහුදු බඩ පළාත් යටත් කර ගැනීම<br>- 1815 උඩරට යටත් කර ගැනීම | | | | |
| | | 2.4 විදේශ ආධිපත්‍යයට එරෙහි සටන්<br>• 1818<br>• 1848 | | | | |

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| **11** | ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය | 3.1 ජාතික පුනරුදයේ පසුබිම | මාර්තු 16 | 05 | පැය 07 | |
| | | 3.2 ආගමික පුනරුදය<br>- බෞද්ධ<br>- හින්දු<br>- ඉස්ලාම් | | | | |
| **දෙවන වාරය** | | | | | | |
| | බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම් | 4.1 කෝල්බෲක් සිට සෝල්බරි දක්වා | මැයි 16 | 10 | පැය 07 | |
| | | 4.2 නිදහස සඳහා උද්ඝෝෂණ සුරියමල් ව්‍යාපාරය | | | | |
| | බ්‍රිතාන්‍යන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය | 5.1 ආර්ථික වෙනස්වීම | ජුනි8 | 10 | පැය 07 | |
| | | 5.2 සමාජ වෙනස්වීම් | | | | |
| | | 5.3 උරුම වූ ප්‍රයෝජනවත් අංග | | | | |
| | | 5.4 අහිතකර බලපෑම් | | | | |
| | ශ්‍රී ලංකාවට නිදහස ලැබීම | 6.1 සෝල්බරි ප්‍රතිසංස්කරණය හා නිදහස ලැබීම | ජුලි 13 | 08 | පැය 05 වි. 30 | |
| | | 6.2 නිදහසින් පසු සංවර්ධන කටයුතු | ජුලි 13 | 04 | පැය 03 | |
| **තෙවන වාරය** | | | | | | |
| | | 6.3 සමාජ සුබසාධනය | සැප්තැම්බර් 18 | 04 | පැය 03 | |

| ශ්‍රේණිය | විෂය ඒකකය | අනු ඒකකය | නිම කිරීමට අපේක්ෂිත දිනය | ඒකක සඳහා යෝජිත කාලච්ඡේද ගණන | ඒකක සඳහා යෝජිත පැය ගණන | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| **11** | ලෝකයේ කැපී පෙනෙන විප්ලව | 7.1 ඇමරිකන් නිදහස් සටන | ඔක්තෝම්බර් 10 | 10 | පැය 07 | |
| | | 7.2 ප්‍රංශ විප්ලවය | | | | |
| | | 7.3 රුසියන් විප්ලවය | | | | |
| | ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන් | 8.1.1 පළමුවන ලෝක සංග්‍රාමය | නොවැම්බර් 14 | 14 | පැය 09 වි. 30 | |
| | | 8.1.2 ජාතීන්ගේ සංගමය | | | | |
| | | 8.1.3 දෙවන ලෝක සංග්‍රාමය | | | | |
| | | 8.2 එක්සත් ජාතීන්ගේ සංවිධානය | | | | |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
## (සබරගමුව පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**
**11 ශ්‍රේණිය**

**ඉතිහාසය**

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 1.1 හැඳින්වීම<br><br>1.2 කාර්මික විප්ලවයේ ආරම්භය හා වර්ධනය<br><br>1.3 කාර්මික විප්ලවයේ ප්‍රබෝධය<br><br>1.4. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑම | • කාර්මික විප්ලවය පාඩමට අදාළ කෙටි ප්‍රශ්න අඩංගු පොතක් සකස් කිරීම.<br>• කාර්මික විප්ලවය ආරම්භ වී ව්‍යාප්ත වූ රටවල් ලෝක සිතියමක ලකුණු කිරීම.<br>• ගුරු අත්පොතෙහි පිටු අංක 6 ඇති අනෙක් ක්‍රියාකාරකම්<br>• පෙළපොතෙහි පාඩමට අදාළ සියලු ක්‍රියාකාරකම් කරවීම.<br>• කාර්මීකරණයේ යහපත් අයහපත් බලපෑම් ඇසුරින් විවාදයක් පැවැත්වීම. | • ගුරු අත්පොතෙහි පිටු අංක 6/9 ඇති ආකාරයට තක්සේරුකරණය<br><br>• අදාළ නිර්ණායක 5 ක් යටතේ ලකුණු ලබාදී ජයග්‍රාහී පිළ තේරීම. | • දේශන හා සාකච්ඡා ක්‍රමය<br>• ගවේෂණ<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණ<br>• වාද විවාද | • අදාළ රූප හා වීඩියෝ පට<br>• නව නිර්මාණ ආශ්‍රිත රූප<br>• ලෝක ආකෘති සිතියම්<br>• නව නිර්මාණ හා සැසඳීමට අදාළ උපකරණ හෝ රූප | • ලෝක ඉතිහාසය (බි.වී. රාවෝ)<br>• යුරෝපා ඉතිහාසය (අ.පො.ස./ උ.පෙ) | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 2.1 බ්‍රිතාන්‍යයන් ආසියාවට පැමිණීමේ පසුබිම | • පෙළ පොතෙහි සඳහන් සියලුම ක්‍රියාකාරකම් කරවීම | ගුරු අත්පොතෙහි පිටු අංක 13/17 ඇති තක්සේරුකරණය | • දේශන හා සාකච්ඡා ක්‍රමය | • බ්‍රිතාන්‍යයන් - ගෙන් ලද දායද, කාසි, නටඹුන් ඇති ස්ථාන වල සජීවී දර්ශන (ක්ෂේත්‍ර චාරිකා මගින්) | | |
| 2.2 බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු | • ගුරු අත්පොතෙහි පිටු අංක 13 ක්‍රියාකාරකම (ප්‍රශ්නාවලියක් සැකසීම) | | • සිතියම් අභ්‍යාස<br>• ගවේෂණ<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් | • අදාල රූප / වීඩියෝ පට<br>• බ්‍රිස්ටල් බෝඩ්<br>• ෆෙල්ට් පෑන් | | |
| 2.3<br>- බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම<br>- දූත ගමන්<br>- 1796 මුහුදුබඩ පළාත් යටත් කර ගැනීම<br>- 1815 උඩරට යටත් කර ගැනීම | • ගුරු අත්පොතෙහි පිටු 17 ආකාරයේ වගුවක් සැකසීම. | | • සංවාද / සාකච්ඡා<br>• ක්ෂේත්‍ර චාරිකා<br>• නිරීක්ෂණ | • ආකෘති ලෝක/ලංකා සිතියම් | • එදා හෙළදිව (රොබට්නොක්ස්)<br>• කෝට්ටේ යුගය (ආචාර්ය S.I. ගමගේ)<br>• පුරාණ යුගය (තිසර පොත් ප්‍රකාශකයෝ)<br>උඩරට රාජධානියි (ටිකිරි අබේසිංහ, ලෝනාදේවරාජ) | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 2.4 විදේශ ආධිපත්‍යයට එරෙහි සටන්<br>• 1818<br>• 1848 | | | | | • සංක්ෂිප්ත ලංකා ඉතිහාසය<br>(K.S. සෙනෙවිරත්ත)<br>• ශ්‍රී ලංකාවේ ඉතිහාසය (සරත් රණවීර) | |
| 3.1 ජාතික පුනරුදයේ පසුබිම<br><br>3.2 ආගමික පුනරුදය<br>- බෞද්ධ<br>- හින්දු<br>- ඉස්ලාම් | • "ආගමික පුනරුදයේ නායකයෝ" මාතෘකාව යටතේ හැකුළුම්පතක් නිර්මාණය<br>• ගුරු අත්පොතෙහි පිටු අංක 22 ඇති ක්‍රියාකාරකම. | • ගුරු අත්පොතෙහි පිටු අංක 22 ඇති තක්සේරුකරණ | • කේවල ක්‍රියාකාරකම්<br>• කණ්ඩායම් ක්‍රියා<br>• නිර්මාණ<br>• ගවේෂණ<br>• සංකල්ප සිතියම්<br>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණ<br>• වාද විවාද | • බ්‍රිස්ටල් බෝඩ්<br>• පුනරුදයේ නායකයන්ගේ පින්තූර<br>• වෙනත් රූප වීඩියෝ පට<br>• අතිරෝක පොත් (නායකයන් පිළිබඳ)<br>• ප්ලැටිග්නම් බ්‍රිස්ටල් බෝඩ් ගම් | • ශ්‍රී ලංකාවේ ඉතිහාසය දෙවන වෙළුම (සරත් රණවීර)<br>• ලංකා ඉතිහාසය ටිකිරි බණ්ඩාර ඒකනායක | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 4.1 කෝල්බෲක් සිට සෝල්බරි දක්වා<br>4.2 නිදහස සඳහා උද්ඝෝෂ සුරියමල් ව්‍යාපාරය | • පෙළ පොතෙහි සියලු අභ්‍යාස කරවීම.<br>• එක් එක් ආණ්ඩුක්‍රමය පිළිබඳ ඉදිරිපත් කිරීම් කිරීමට කණ්ඩායම් වලට පැවරීම.<br>• සංකල්ප සිතියම් නිර්මාණය කිරීම.<br>• ගුරු අත්පොතෙහි පිටු (25) ඇමුණුම 01<br>• කෙටි ප්‍රශ්න හා පිළිතුරු | • ගුරු අත්පොතෙහි පිටු 25 ඇති තක්සේරුකරණය | • සංකල්ප සිතියම්<br>• ස්වයං අධ්‍යයනය<br>• කණ්ඩායම් ක්‍රියා<br>• කේවල ක්‍රියා<br>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණ | • බ්‍රිස්ටල් බෝඩ්<br>• පෑන් ප්ලැටිග්නම්<br>• පිටු පෙරළනය | • ශ්‍රී ලංකා ගම් සභා ක්‍රමයේ ඉතිහාසය (මාලනි ඇඳගම)<br>• ඉංග්‍රීසි ආණ්ඩුක්‍රමය (වොල්ටර් බේජෝ)<br>• ලංකා ආණ්ඩුක්‍රම විකාශනය (W. ජයවර්ධන) | |
| 5.1 ආර්ථික වෙනස්වීම<br>5.2 සමාජ වෙනස්වීම්<br>5.3 උරුම වූ ප්‍රයෝජනවත් අංග<br>5.4 අහිතකර බලපෑම් | • කේවල ක්‍රියාකාරකම්, ලංකාවේ ආනයන අපනයන ආර්ථික රටාවකට යොමු වූ අයුරු ලිපියක් සැකසීම.<br>• ගුරු අත්පොතෙහි 28 පිටුවේ ක්‍රියාකාරකම<br>• බ්‍රිතාන්‍ය පාලනයේ යහපත්/අයහපත් බලපෑම් විවාදයක් කිරීම.<br>• ලංකා සිතියමක තේ/රබර්/පොල් ව්‍යාප්තිය, පර්යේෂණ මධ්‍යස්ථාන | • ගුරු අත් පොතෙහි පිටු අංක 28/30/32 ඇති තක්සේරුකරණය | • දේශන හා සාකච්ඡා<br>• සිතියම් අභ්‍යාස<br>• වාද විවාද<br>• ගවේෂණ<br>• කේවල ක්‍රියා / කණ්ඩායම් ක්‍රියා<br>• අධ්‍යාපන චාරිකා | • ලංකා සිතියම් ආකෘති<br>• සංස්කෘතියට එකතු වූ නව අංග පෙන්වීම. (ආහාර / ඇඳුම් සිරිත් විරිත්)<br>• අධ්‍යාපන චාරිකා මඟින් (වතු වගාව, මහා මාර්ග, දුම්රිය මාර්ග) | • ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි බලය (ආචාර්ය ආර් අරසරත්නම්)<br>• ලංකා ඉතිහාසය අධ්‍යාපන ප්‍රකාශන (IV කොටස) | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 6.1 සෝල්බරි ප්‍රතිසංස්කරණය හා නිදහස ලැබීම<br><br>6.2 නිදහසින් පසු සංවර්ධන කටයුතු<br><br>6.3 සමාජ සුබසාධනය | • ලංකාවේ 1978 තෙක් මැතිවරණ සඳහා සංකල්ප සිතියමක් නිර්මාණය<br>• 1972 හා 1978 ව්‍යවස්ථා වල වෙනස්කම් වගුවක සටහන් කිරීම.<br>(ගුරු අත්පොතෙහි පිටු අංක 35 ඇමුණුම)<br>• ගුරු අත්පොතෙහි පිටු අංක 38 ඇත කේවල ක්‍රියාකාරකම<br>• ලංකා සිතියමක ගොවිජනපද / බහුකාර්ය යෝජනා / ජලාශ ලකුණු කිරීම | • ගුරු අත්පොතෙහි පිටු අංක 36/39 ඇති තක්සේරුකරණය | • කේවල ක්‍රියාකාරකම්<br>• සංකල්ප සිතියම්<br>• කණ්ඩායම් ක්‍රියා<br>• සිතියම් ලකුණු කිරීම.<br>• දේශන හා සාකච්ඡා ක්‍රමය | • ලංකා ආකෘති සිතියම්<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව<br>• අදාළ රූප හෝ වීඩියෝ පට<br>• රාජ්‍ය නායකයන්ගේ චරිතාපදාන / පින්තූර | • ලංකා ආණ්ඩුක්‍රම විකාශනය (W. ජයවර්ධන)<br>• විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය හා රාජ්‍ය පාලනය (K. වැන්සස් පෙරේරා)<br>• දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත (එම්.ඕ.ඒ. ද සොයිසා) | |
| 7.1 ඇමරිකන් නිදහස් සටන | • “ඇමරිකානු නිදහස් සටන ලෝක ඉතිහාසයේ වැදගත් වන අයුරු” මාතෘකාවට අදාළ රචනයක් ලිවීම. | • ගුරු අත්පොතෙහි පිටු අංක 41/43/45 හි තක්සේරුකරණය | • කේවල ක්‍රියාකාරකම්<br>• දේශන හා සාකච්ඡා | • රූප හා වීඩියෝ පට<br>• ඇමරිකානු විප්ලවය පිළිබඳ රචිත පොත්පත් | • ලෝක ඉතිහාසය (බී.වී. රාවෝ)<br>• යුරෝපා ඉතිහාසය (අ.පො.ස. / උ.පෙ) | |

| අනු ඒකකය | ඒකකයට අදාළ පැවරම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් | ඒකකයට අදාළ තක්සේරුකරණ ආකෘති හා ආකෘති ප්‍රශ්න | ඒකකයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | ඉගෙනුම් ආධාරක | අතිරේක කියවීම් හෝ නිරීක්ෂණය සඳහා යොමු කිරීම් | ප්‍රායෝගික පරීක්ෂණ හෝ වෙනත් අධ්‍යයන ක්‍රම |
|---|---|---|---|---|---|---|
| 7.2 ප්‍රංශ විප්ලවය<br><br>7.3 රුසියන් විප්ලවය | • උතුරු ඇමරිකා මහද්වීපය තුළ ජනපද ලකුණු කිරීම.<br>• ගුරු අත්පොතෙහි පිටු අංක 43 හා 45 හි ඇති ක්‍රියාකාරකම්<br>• ප්‍රංශ හා රුසියන් ඇමරිකා විප්ලව ඇසුරින් ප්‍රශ්නෝත්තර තරඟාවලියක් | | • ගවේෂණ<br>• සිතියම් ලකුණු කිරීම<br>• ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්<br>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණ | • ලෝක ආකෘති සිතියම් (උතුරු ඇ. මහද්වීපය) | | |
| 8.1.1 පළමුවන ලෝක සංග්‍රාමය<br><br>8.1.2 ජාතීන්ගේ සංගමය<br><br>8.1.3 දෙවන ලෝක සංග්‍රාමය<br><br>8.2 එක්සත් ජාතීන්ගේ සංවිධානය | • I ලෝක යුද්ධයට හා II ලෝක යුද්ධයට අදාළ රටවල් සිතියමක ලකුණු කිරීම<br>• පිටු අංක 48 (ගුරු අත්පොත) හි ඇති පොත් පිංචත් සැදීමේ කේවල ක්‍රියාකාරකම්<br><br>• ගුරු අත් පොතෙහි පිටු අංක 50/52 හි ඇති ක්‍රියාකාරකම් හා පෙළ පොතෙහි ඇති සියලුම ක්‍රියාකාරකම්. | • පිටු අංක 48/52 ඇති (ගුරු අත්පොත) තක්සේරුකරණය | • කණ්ඩායම් ක්‍රියා<br>• දේශන<br>• ගවේෂණ<br>• කේවල ක්‍රියාකරකම්<br>• විවෘත ග්‍රන්ථ පරීක්ෂණ<br>• සංවාද<br>• ප්‍රශ්නාවලි<br>• සිතියම් ලකුණු කිරීම<br>• සංකල්ප සිතියම් | • I ලෝක යුද්ධය හා සම්බන්ධ ඡායාරූප, සිතියම්<br>• වීඩියෝ පට හා සිනමා පට<br>• ලෝක ආකෘති සිතියම් | • ලෝක ඉතිහාසය (B.V. රාවෝ)<br>• යුරෝපා ඉතිහාසය (අ.පො.ස / උ.පෙ) | |